**වැලිගම නගර සභාව - 2022**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වැලිගම නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | --------------------- | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.731,816 ක ණයහිමි ශේෂය වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීම් සිදු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 98 කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.475,470 ක් වූ දැන්වීම් පුවරු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට භෞතිකව සභාව සතුව නොතිබූ වාහන 06 ක එකතු වටිනාකම රු. 789,000 ක් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගත් ණය මුදලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.762,718 ක පොලී මුදල වෙනුවෙන් විවිධ ණයහිමි යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට තොග ශුද්ධ වටිනාකම රු.106,754 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 4,109,283 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු. 9,389,427 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ටෙන්ඩර් ගාස්තු රු.605,407 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.697,275 ක් වූ විනෝද බදු ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.75,152,187 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,179,098 ක අසමානතා පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උප ලේඛන, කාල විශ්ලේෂණ හා ශේෂ සනාථන ආදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,972,622 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලේඛන යාවත්කාලීන කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.22,120,182 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු. 30,991,088 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,300,000 | 12,384,551 | 12,089,483 | 12,740,641 | 15,300,000 | 11,449,284 | 8,776,948 | 12,445,573 |
| කුලී | 22,576,000 | 22,544,981 | 19,830,187 | 20,917,259 | 9,385,000 | 16,178,843 | 15,241,318 | 18,202,465 |
| බලපත්‍ර ගාස්තු | 8,463,000 | 5,427,875 | 5,641,995 | 336,459 | 8,762,500 | 3,192,330 | 3,246,330 | 550,579 |
| වෙනත් ආදායම් | 17,494,000 | 12,741,299 | 13,200,373 | 848,893 | 17,250,000 | 11,120,084 | 10,295,003 | 1,307,967 |
| එකතුව | 63,833,000 | 53,098,706 | 50,762,038 | 34,843,252 | 50,697,500 | 41,940,541 | 37,559,599 | 32,506,584 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.12,536,056 ක් වූ අතර, වරිපනම් ඒකක 9776 කට අදාළව වර්ෂය තුලදී බිල් කිරීම් රු.8,190,129 ක් සමඟ රු.20,726,185 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම රු. 7,958,432 ක් වීම නිසා වර්ෂය අවසානයට වරිපනම් ඒකක 5,536 කට අදාළව රු. 12,767,753 ක හිඟ ශේෂයක් පැවැතුණි. | හිඟ ශේෂය අවම කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් කඩිනමින් අයකළ යුතු වේ. |
| (ආ) | සභාව සතු කඩ කාමර 230න් 227 ක් බදු දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් බදුකරුවන් 129 දෙනෙකුගෙන් රු. 10,584,681 ක් අයවිය යුතුව පැවතුණි. | හිඟ කඩකුළී අය කර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නගර සභාවට අයත් ස්ථාන 14 ක පිහිටි කඩ කාමර 41 ක් ගිවිසුම්ගතවීමකින් තොරව බදු දී තිබුණි. | කඩ කාමර පවරා ගැනීමේ කටයුතු සිදු කරන බව. | කඩ කාමර බදු දීමේදී ගිවිසුම්ගත විය යුතු වේ. |
| (ඈ) | වැලිගම නගර සභාවේ වෙළෙඳ සංකීර්ණ 05 කට අයත් කඩ කාමර 06 කට අදාළව කඩ කාමර බදු දීමේදී අය කළ යුතු එක්වන් මුදල වූ රු. 857,032 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි. | ප්‍රතිචාරයක් නොමැති හා ගිවිසුම්ගත නොවූ කඩ කාමර පවරා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.24,852,325 ක් ලැබිය යුතුව තිබුණි. | ලිපි මගින් ඉල්ලීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඊ) | වැලිගම නගර සභා බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් හා ආපනශාලා 28 ක් සම්බන්ධයෙන් සමීක්ෂණය සිදු කර ගාස්තු අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | බලපත්‍ර ගාස්තු නොගෙවූ ආයතන කිහිපයක් සඳහා නඩු පවරා ඇති බව. | කඩිනමින් ආදායම් අය කළ යුතු වේ. |
| (උ) | සභාව සතු වැලිගම තානායම නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති පෞද්ගලික ආයතනයකට පවරා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු1,720,861ක හිඟ කළමනාකරණ ගාස්තු අය කරගෙන නොතිබුණි. | තානායම නැවත සභාව වෙත පවරා ගැනීමට අදාළ පාර්ශවයන් වෙත ලිපි මගින් දැනුවත් කර ඇති බව. | කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඌ) | සභාව සතු වාර්ෂිකව ටෙන්ඩර් කරනු ලබන දේපළ 09 කින් 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය අතර කාලපරිච්ඡේදයට අදාළ රු.5,701,777 ක හිඟ මුදලක් අයකරගෙන නොතිබුණි. | නීතිමය කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ඉල්ලා ඇති බව. | කඩිනමින් අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | සමාලෝචිත වර්ෂයේදී සංචාරක ප්‍රවර්ධන වැඩ සටහන යටතේ සභාවේ සහයෝගයෙන් පෞද්ගලික ආයතනයක් විසින් පවත්වන ලද සැණකෙළියකින් සභාවට අය විය යුතු විනෝද බදු රු.697,275 ක් අය කරගෙන නොතිබුණි. | නීතිමය කටයුතු කිරීමට සමථ මූල මණ්ඩලය වෙත ලිපි මගින් ඉල්ලීම් කර ඇති බව. | ඉදිරියේදී විනෝද බදු සම්බන්ධ පාලන ක්‍රම අනුගමනය කළයුතු අතර හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1992 වර්ෂයේදී විදුලිය සැපයීමට ලංකා විදුලි බල මණ්ඩලයට පවරා දීමේදී ගෙවිය යුතු මුදල ලෙස දක්වා තිබූ රු.1,884,306 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීම සඳහා කමිටුවට ඉදිරිපත් කර ඇති බව. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය හරහා 1995 වර්ෂයේදී වසර 22 ක් තුල පියවීමේ පදනම මත ලබා දී තිබූ රු.1,759,550 ක ණය මුදල පියවීමේ කාලය 2017 වර්ෂයෙන් අවසන් වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. | විස්තරාත්මක උපලේඛණ සොයා ගැනීමට අපහසු වී ඇති බව. | කඩිනමින් නිරවුල් කළ යුතු වේ. |
| (ඇ) | පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඌනතා ලෙස හඳුනා ගනු ලැබූ රු. 125,815 ක් වටිනා භාණ්ඩ වර්ග 15 කට අයත් අයිතම 88 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පරීක්ෂා කිරීමෙන් අනතුරුව වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන අවශ්‍ය පියවර ගන්නා බව. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | අංක 09/2019 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (iv) වගන්තියේ විධිවිධානවලින් බැහැරව ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන දින 85 ක් වෙනුවෙන් නිලධාරීන් 04 දෙනෙකුට නිවාඩු දින වැටුප් ලෙස රු. 241,748 ක් ගෙවා තිබුණි. | එම කාල පරිච්ඡේදයේ නිවාඩු දින සේවය කිරීමේදීද ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකළ බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 3.2 වගන්තියේ විධිවිධානවලින් බැහැරව නිලධාරීන් හා සේවකයින්ට සාමාන්‍ය රාජකාරී වේලාව තුළ ඉටු කළ හැකි කාර්යයන් සඳහා අතිකාල දීමනා ලෙස රු.2,020,597 ක් ගෙවා තිබුණි. | හදිසි රාජකාරී කටයුතු ඉටු කිරීමට සිදු වූ නිසා බොහෝ නිලධාරීන්ට සාමාන්‍ය රාජකාරී දිනයන් වලට අමතරව සති අන්තයේද රාජකාරී ඉටු කිරීමට සිදු වීම නිසා අතිකාල දීමනා ගෙවීමට සිදු වූ බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍ර 590 ක් නිකුත් කර තිබූ අතර එයින් 78 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. | පසු විපරම් සිදු කර වරිපනම් බදු අය කර ගැනීම සඳහා කටයුතු කරන බව. | වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | නාගරික සීමාව ඇතුළත සංවර්ධන බලපත්‍රයක් ලබා ගැනීමකින් තොරව සිදු කර තිබූ ඉදිකිරීම් සම්බන්ධයෙන් 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උප ලේඛනය ප්‍රකාරව රු.341,840 ක ගාස්තු අය කර එම ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලිපි මගින් දන්වා යවා ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සභාවේ සේවය කර විශ්‍රාම ගිය, සේවය හැර ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවීමට තිබූ රු.687,658 ක ණය ශේෂය අය කරගෙන නොතිබුණි. | අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | ණය ශේෂ නිරවුල් කිරිමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාවේ ස්ථිර සේවයේ නියුක්ත වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 07 දෙනෙකුට, සෞඛ්‍ය කම්කරුවෙකු, සහ තාවකාලික කම්කරුවෙකු වෙත තනතුරට අදාළ නොවන වෙනත් රාජකාරි පවරා සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු. 5,554,815 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. | සේවා අවශ්‍යතාවය මත රාජකාරි පැවරීම් සිදු කර ඇති බව. | නියමිත රාජකාරී පැවරීම් කළ යුතු වේ. |